# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020-2030 ප්‍රතිපත්ති රාමුව සමාලෝචනය කිරීම සඳහා උපදේශකයන් සඳහා කෙරෙන ආරාධනාවයි

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2020-2030 සමාලෝචනය කිරීම සඳහා, සුදුසුකම් සහිත හා පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුව, ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂේත්‍රයේ වත්මන් තත්ත්වය සහ රජයේ උපායමාර්ගික දිශානතිය සමඟින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවෙහි අදාළත්වය සහ පෙළ ගැස්ම සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුව පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව බැඳී සිටී. ඒ අනුව, මෙම තීරණාත්මක සමාලෝචන ක්‍රියාවලියට දායකවීම සඳහා යෝග්‍ය සහ සුදුසුකම් ලත් අධ්‍යාපන අංශයේ උපදේශකයන් වෙතින් අයදුම්පත් කැඳවේ.

---

## ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවේ විෂය පථය:

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමයේ උප අංශ අටක් ආවරණය කරයි:

1. මුල් ළමා විය රැකවරණය සහ අධ්‍යාපනය
2. සාමාන්‍ය අධ්‍යාපනය
3. උසස් අධ්‍යාපනය
4. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය
5. පිරිවෙන් අධ්‍යාපනය
6. විශේෂ සහ අන්තර්කරණ අධ්‍යාපනය
7. නොවිධිමත් අධ්‍යාපනය
8. ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය

සෑම සමාලෝචන කමිටුවක්ම විෂය - විශේෂිත උපදේශකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. එක් උපදේශකයෙකු ප්‍රධාන උපදේශකයා ලෙස කටයුතු කරනු ඇති අතර, නිශ්චිත කාල රාමුවක් තුළ අවසාන සමාලෝචන වාර්තාව සම්පාදනය කිරීම සඳහා ඔහු / ඇය වගකිව යුතුය.

---

## අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද:

1. අදාළ අධ්‍යාපන අංශයේ අවම වශයෙන් වසර 10 ක ජාතික හෝ ජාත්‍යන්තර පළපුරුද්දක් තිබීම.
2. අයදුම්කරුවන් විශ්වවිද්‍යාල හෝ පිළිගත් අධ්‍යාපන ආයතන සමඟ අනුබද්ධිත ශාස්ත්‍රඥයින් වීම වඩාත් සුදුසුය.
3. අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේ සහ ආයතනික හෝ ආංශික වාර්තා සකස් කිරීමේදී ක්‍රියාකාරී සහභාගීත්වයක් පිළිබඳ අත්දැකීම් ඇති අය වෙත ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

---

## කොන්දේසි

- අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව - 2020-2030 කෙටුම්පත් කළ කණ්ඩායමේ සාමාජිකයන් නොවිය යුතුය.

**සටහන:** සමාලෝචන පැවරුම සාර්ථකව නිම කිරීමෙන් පසු ගෞරව දීමනාවක් ලබා දෙනු ලැබේ.

---

## අයදුම් කිරීමේ උපදෙස්:

උනන්දුවක් දක්වන පුද්ගලයන් විසින් තමන් විසින්ම සකස් කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් (CV), ඊමේල්, ෆැක්ස් මගින් හෝ තැපෑලෙන් පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
පළමු මහල, ගොඩනැගිලි අංක 5. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (BMICH), කොළඹ 07.

ඊමේල් : secnec@slt.lk
දුක/ ෆැක්ස් : 011-2662064
වෙබ් අඩවිය : www.nec.gov.lk
අවසාන දිනය : අයදුම්පත් **2025 අගෝස්තු 24** හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

**ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව ඔබ තෝරාගත් විෂය ක්ෂේත්‍රය සටහන් කරන්න.**

**"ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) - සමාලෝචනය සඳහා උපදේශකයන් (තෝරාගත් ක්ෂේත්‍රය)"**

සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
2025 අගෝස්තු 03